# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,645 — 1959 ජනවාරි 23 වැනි සිකුරාද — 23.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 71 |
| තනතුරු-ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 72 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| අය වැය ලේඛන ... ... | — |
| දේපල විකිණීම ... ... | — |
| මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 75 |


## පළාත් පාලන නිවේදන

### උඩුනුවර කඳුපළාත ගම්කායර්‍ය සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණත**

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපණතේ 13ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි තිසි බලධාරියාවූ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම් කායර්‍ය සභාවේ සභාපති යූ. ඇල්. නූර්මොහමඩ් වන මම, 1959 වර්ෂයේ පහත් දැක්වෙන් උප ලේඛණයෙහි සඳහන් වන දිනවලදී උඩුනුවර කඳුපළාත ගම්කායර්‍ය සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

1959 ජනවාරි 24,
1959 පෙබරවාරි 23,
1959 මාර්තු 23,
1959 අප්‍රේල් 23,
1959 මැයි 22,
1959 ජූනි 20,
1959 ජූලි 19,
1959 අගෝස්තු 18,
1959 සැප්තැම්බර් 16,
1959 ඔක්තෝබර් 16,
1959 නොවැම්බර් 15 සහ
1959 දෙසැම්බර් 14.

යූ. ඇල්. නූර්මොහමඩ්,
උඩුනුවර කඳුපළාත ගම්කායර්‍ය සභාවේ සභාපතිතැන.

1959 ජනවාරි 15 වැනි දින.
උඩුනුවර කඳුපළාත ගම්සභා කායර්‍යාලය,
වෙළම්බොඩ, ...

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපලාත ගම්කායර්‍ය සභාව

**1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනත**

1951 කේ අංක. 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 13 (ඒ) (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අදිකාරි තැනවූද නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපලාත ගම්කායර්‍ය සභාපති වූද කේ. එච්. පද්මසිරි වන මම, 1959 වර්ෂයේ මෙහි පහත සඳහන්වන උපලේඛනයේ දැක්වෙන දිනවලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපලාත ගම්කායර්‍ය සභා ප්‍රදේශ සීමාව ඇතුලත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

ජනවාරි 25,
පෙබරවාරි 1, 8, 16, 23.
මාර්තු 2, 9, 17, 25, 31.
අප්‍රේල් 8, 16, 23, 30.
මැයි 8, 16, 22, 29.
ජූනි 6, 14, 21, 28.
ජූලි 6, 13, 20, 27.
අගෝස්තු 4, 11, 18, 26.
සැප්තැම්බර් 3, 10, 17, 25.
ඔක්තෝබර් 2, 9, 16, 25.
නොවැම්බර් 1, 7, 15, 23, 30.
දෙසැම්බර් 7, 15, 23, 30.

කේ. එච්. පද්මසිරි.
උඩපලාත ගම්කායර්‍ය සභාවේ සභාපති තැන.

වර්ෂ 1959 ක්වූ ජනවාරි මස 16 වෙනි දින,
රාගල, හල්ගරන්ඔය පිහිටි උඩපලාත
ගම්කායර්‍ය සභා කායර්‍යාලයේදීය.

### උඩුනුවර කඳුපළාත ගම්කායයි සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වන පරිච්ඡේදය) 13 ඒ වගන්තිය යටතේ නිකුත් කරන නියෝගයයි**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වන පරිච්ඡේදය 13ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නිසි බලධාරියා වූ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම්කායයි සභාවේ සභාපති යූ. ඇල්. නූර්මොහමඩ් වන මම, 1959 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන කාල සීමාව තුළ උඩුනුවර කඳුපළාත ගම් ප්‍රදේශය ඇතුළත මස් පිණිස මීහරක් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

යූ. ඇල්. නූර්මොහමඩ්,
උඩුනුවර කඳුපළාත ගම්කායයි සභාවේ සභාපතිතුන.

1959 ජනවාරි 15 වැනි දින,
උඩුනුවර කඳුපළාත ගම්සභා කායයාලය,
වෙළම්බොඩ,

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී.—ජී ඊ. 14/21/6.

**ගම්සභා ආඥාපණත**

ගම්සභා ආඥාපණතේ (198 පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ආඩිඅම්බලම ගම්ප්‍රදේශයේ ගම් කායයිසභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 දෙසැම්බර් 17 දින,
කොළඹ.

**අතුරු ව්‍යවස්ථා**

වර්ෂ 1954, නොවැම්බර් මස 5, දින හා අංක 10,731 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද අප්‍රසන්නවූ හා අන්තරාදායක කම්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙහි පහත සඳහන් ප්‍රකාර සංශොධනය කරනු ලැබේ :—

1. එහි 1 වැනි ඡේදයෙහි (ඇස්) අක්ෂරය දරණ කාරණය එක්කම ඊළඟට මෙහි පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙනි :—

(ටී) ගෘහ භාණ්ඩ සෑදීම.

(යූ) ගෘහ භාණ්ඩ ගබඩා කිරීම.

(වී) වෙළෙඳාම සඳහා පොල් රැස්කර තැබීම.

(ඩබ්ලිව්) හිසකෙස් හා රැවුල් කපන ස්ථානයක් නොහොත් බාබර් සාප්පුවක් තබාගැණීම.

(ඇක්ස්) රෙදිපිළි වෙළෙඳ ශාලාවක් තබාගැණීම.

(වයි) යකඩබඩු ගබඩාවක් තබා ගැනීම.

(ඉසැඩ්) ගෝනි ගබඩා කිරීම.

(ඒඒ) සිල්ලර වෙළෙඳාම සඳහා සාප්පුවක් හෝ ආයතනයක් තබාගැනීම.

(බීබී) කෙඳි හෝ කොහුවලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.

(සීසී) මස් වියලීම හෝ ලුණුදමා සකස් කිරීම.

(ඩීඩී) තලතෙල් හිඳීම.

(ඊඊ) රෙදිපිළි පිරිසිදු කරන ස්ථානයක් තබා ගැනීම.

(ඇෆ්ඇෆ්) වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කිරීම.

(ජීජී) හිස් බෝතල් ගබඩා කිරීම.

(එච්එච්) පින්තූර හෝ ඡායාරූප රාමු කිරීමේ සාප්පුවක් තබා ගැනීම.

(අයිඅයි) මොනම වර්ගයක හෝ තෙල් ගබඩා කිරීම.

(ජේජේ) වඩු කම්මාන්ත ශාලාවක් තබා ගැනීම.

(කේකේ) දර මඩුවක් තබාගැණීම.

(ඇල්ඇල්) දුම්කොළ ගබඩා කිරීම.

(ඇම්ඇම්) සබන් ගබඩා කිරීම.

(ඇන්ඇන්) උළු හෝ ගඩොල් ගබඩා කිරීම.

(ඕඕ) ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීම සඳහා වැඩපළක් තබා ගැනීම.

(පීපී) පොල්තෙල් ගබඩා කිරීම.

(කිව්කිව්) පොල්ලෙලි පොගවා සකස් කිරීම සඳහා (පොල්ලෙලි) කොටුවක් තබාගැනීම.

(ආර්ආර්) බෙලෙක් වැඩපලක් තබා ගැනීම.

(ඇස්ඇස්) මිණිපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.

(ටීටී) වාර්නිස් හෝ තීන්ත වර්ග ගබඩා කිරීම.

(යූයූ) පරණ යකඩ බඩු යනාදිය වෙළෙඳාම සඳහා ස්ථානයක් තබා ගැණීම.

(වීවී) පුන්නක්කු හෝ වෙනත් ඕනෑම වර්ගයක සත්ව ආහාර ගබඩා කිරීම;

(ඩබ්ලිව්ඩබ්ලිව්) සිමෙන්ති ගබඩා කිරීම.

(ඇක්ස්ඇක්ස්) සත්ව තෙල් පෙරීම.

2. එහි 2 වගන්තියෙහි (ආර්) අක්ෂරය දරණ කාරණය එක්කම ඊළඟට මෙහි පහත සඳහන් අළුත් කාරණා ඇතුළත් යෙදීමෙනි :—

(ඇස්) අඟුරු සඳහා පොල්කටු පිච්චීම,

(ටී) පොල්කටු අඟුරු ගබඩා කිරීම.

(යූ) රබර් ගබඩා කිරීම.

(වී) ඡායාරූප ගැණීමේ ශාලාවක් තබාගැණීම.

(ඩබ්ලිව්) ටයර් සහ ටියුබ් වොල්කනයිසින් කිරීමේ ස්ථානයක් තබාගැණීම.

(ඇක්ස්) තෙල්වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදි දැවෙන ද්‍රව්‍යවලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන්. හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන කම්මාන්තයක්.

(වයි) විදුලි භාණ්ඩ සෑදීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.

(ඉසැඩ්) යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.

(ඒඒ) ගල් හෝ කළුගල් කැඩීම.

(බීබී) ගල් හෝ කළුගල් ගබඩා කිරීම.

(සීසී) ලී ඉරීම.

(ඩීඩී) මෝටර් රථ හා ලොරි පවිත්‍ර කිරීම සඳහා ස්ථානයක් තබා ගැණීම.

(ඊඊ) මෝටර් හා පදින බයිසිකල් පවිත්‍ර කිරීම සඳහා ස්ථානයක් තබා ගැණීම.

(ඇෆ්ඇෆ්) ගිනිකෙළිභාණ්ඩ සෑදීම.

(ජීජී) ගිණිකෙළිභාණ්ඩ ගබඩා කිරීම.

(එච්එච්) ගිණිපෙට්ටි සෑදීම.

(අයිඅයි) වී, කුරක්කන් හෝ වෙනත් ඕනෑම ධාන්‍ය වර්ගයක් යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම.

ඇල්. ඩී.—බී 150/46

ඇල්. ජී. ඩී.—ජී අයි. 11/2 ඩී

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ගන්දහය උතුර ගම්ප්‍රදේශයේ ගම්කායඹ සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යකායඹාංශයේ ස්ථිර ලේකම් තැන.

1959 ජනවාරි 8 වැනි දින,
කොළඹදීය.

#### අප්‍රසන්නවූ හා අන්තරාදයකවූ කර්මාන්ත සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාව

1. (1) පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදයකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

කොප්පරා වියලීම,

ක්බොක්ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමට ගල්වළවල් කැපීම,

කපාපු පොල් වියලා සකස් කිරීම,

කොප්පරා ගබඩා කිරීම,

මිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම,

යන්ත්‍ර සූත්‍ර මාගීයෙන් හෝ සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම,

පැඟිරිතෙල් සිඳීම,

කෙඳි වගී තෙලීම සහ ගබඩා කිරීම,

කුරුඳුතෙල් සිඳීම,

කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම,

ලී මඩුවක් තබාගැනීම,

දර මඩුවක් තබා ගැනීම,

ස්වර්ණාභරණ සෑදීම,

කම්හලක් තබාගැනීම,

භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,

මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම,

තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම,

අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම,

හාල් මෝලක් තබා ගැනීම,

බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම,

මෝටර් රථ අළුත් වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම,

ගෘහ භාණ්ඩ සෑදීම,

සෝඩා, ලෙමනේඩ් ආදී සිසිල් බීම වගී සෑදීම,

ලී ඉරන මෝලක් තබා ගැනීම.

(2) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

ජාඩි හෝ කරවල හෝ ගබඩා කිරීම,

නොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,

මිරිස් සහ වෙනත් තුන පහ වගී යන්ත්‍ර සූත්‍ර මාගීයෙන් ඇඹරීම.

කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම,

විනාකිරි සෑදීම,

සබන් සෑදීම,

හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.

පුවක් වියලා සකස් කිරීම,

සතුන්ගේ ලේ හෝ මළකුණු උණු කිරීම.

සතුන්ගේ හම් ගබඩා කිරීම,

සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම,

මාළු අයිස් දැමීම,

ලැලි පොඟවා සකස් කිරීම.

රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම,

කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,

කෝඩා සෑදීම,

දුම්කොළ වියලා සකස් කිරීම,

සුරුට්ටු සෑදීම,

පැණි හකුරු සෑදීම,

රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම.

බීඩි සෑදීම,

පොල්ලෙලි පෙඟවීම පිණිස (පොල්ලෙලි කොටුවක්) තබා ගැනීම.

(3) පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදයකවූද, අප්‍රසන්නවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

කෙඳි සායම් කිරීම,

ගඩොල් හෝ උළු පිළිස්සීම,

බැටරි චාජ් කිරීම,

හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලිවලට කැඩීම,

අඟුරු සඳහා පොල් කටු පිළිස්සීම.

---

ඇල්. ජී. ඩී./ජී. ජේ 9/17.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලාපිටිහම් පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායඹ සභාව විසින් සම්පාදිත 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායඹාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 දෙසැම්බර් 31 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථා

#### අප්‍රසන්නවූ හා අන්තරාදයකවූ කර්මාන්ත

1. පහත සඳහන් කර්මාන්ත අන්තරාදයකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(අ) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම;

(ආ) හාල් මෝලක් තබාගැනීම;

(ඇ) මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම;

(ඈ) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම;

(ඉ) කම්හලක් තබාගැනීම;

(ඊ) ස්වර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් තබාගැනීම;

(උ) වඩුම්ඩුවක් තබාගැනීම.

2. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ.

(අ) ජාඩි හෝ කරවල ගබඩා කිරීම;

(ආ) තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම;

(ඇ) කෘත්‍රිම පොහොර හා කෘත්‍රිම පොහොර සෑදීම සඳහා පාවිච්චි කරන ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වැඩියෙන් ගබඩා කිරීම.

3. පහත් සඳහන් කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරාදයකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ.

(අ) ගඩොල් හෝ උළු පිලිස්සීම;

(ආ) හුනුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස්කිරීම හෝ කැබලි කිරීම.

ඉහත සඳහන් විස්තරය සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

අයිතිකාරයාගේ අත්සන :————.

දිනය :————.

* නුවමනා වචන කපා හරිනු.

"බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා | ඇ. ග. වා. |
| සෑම ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ඇ. ග. බ. ක. |
| තනි ගොනා බඳින බර බාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ඇ. ග. බා. ක. |
| සෑම බයිසිකලයක් සඳහා | ඇ. ග. බ. |
| සෑම අත්කරත්තයක් සඳහා | ඇ. ග. අ. ක. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා | ඇ. ග. ජී. |

# විවිධ දැන්වීම්

## නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන් හි 1959 වර්‍ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශොධිත ආඥාපණතේ 6 වෙනි වගන්තියේ සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන නාරම්මල ගම් ප්‍රදේශයේ ගම් කායර්‍ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

පී. බී. මැදගොඩ,
නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාවේ සභාපති තැන.

1959ක්වූ ජනවාරි මස 13 වෙනි දින,
නාරම්මල ගම්කායර්‍ය සභා කායර්‍යාලයේ දීය.

උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඒ. සී. ඇම්. ස්මායිල්, 73, පුත්තලම් පාර, කුරුණෑගල. | ඔයගාව වත්ත, පොල්ගහයාය, හරක් මස් සහ එළු මස් |
| 2. ඒ. ඇස්. සෙයියදු ඉබ්රම්සා, මීගමු පාර, නාරම්මල | අස්වැද්දුම වත්ත, පොල්ගහයාය හරක් මස් සහ එළු මස් |
| 3. ඒ. ඇස්. සෙයියදු ඉබ්රම්සා, මීගමු පාර, නාරම්මල. | ප්‍රසිඞ වෙළඳපල, නාරම්මල, හරක් මස් සහ එළු මස් |
| 4. ඇස්. ජී. ඕ. මොහමඩ් සාලි, මස් මාර්කට්, නො. 1, කුලියපිටිය. | ප්‍රසිඞ වෙළඳපල, නාරම්මල, හරක් මස් සහ එළු මස් |

## පිස්සු බලු ආඥාපණත

නාගරිකසභා මායිම් ඇතුළතවූ මුළු කොළඹ නගරයම පිස්සු බල්ලන් සිටින නොහොත් පිස්සු බල්ලන්ගෙන් අනතුරු තිබෙන ප්‍රදෙශයක් බව මෙයින් ප්‍රකාශ කරමි.

බැඳ නොතැබූ නැතහොත් බැඳ ගෙනයනු නොලබන බල්ලෙකු යම් ප්‍රසිඞ ස්ථානයක හෝ පාරකදී සම්භවුවහොත් ඌ විනාශකර දමනු ලැබේ.

පිස්සු බල්ලන් සපාකෑමෙන් සෑදෙන ලෙඩ වලකන බෙහෙත් මැගසින් රෝඩ්හි පිස්සුබලු ස්ප්‍රිතාලයේදී නොමිළයේ විදිනු ලැබේ.

බී. ඒ. ජයසිංහ,
කොළඹ නගර සභාවේ විශේෂ කොමසාරිස්තුමා සහ
කොළඹ නාගරික කොමසාරිස් තැන.

කොළඹ නගර ශාලාවේදීය.
1.1.1959.

---

## මාකඳුර ගම්කායර්‍ය සභාව—ගෝනාවිල

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඞව මාකඳුර ගම් කායර්‍ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරණ සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශොධිත වූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඊ. සුභසිංහ,
මාකඳුර ගම්කායර්‍ය සභාපති.

මාකඳුර ගම්කායර්‍ය සභාව කායර්‍යාලයය,
ගෝනාවිල. 12.1.1959.

උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. කේ. ෂරීප්, අංක 48, සුලේකා ස්ටෝර්ස්, කොච්චිකඩේ. | මහායාය වත්ත, මාකඳුර, "හරක් මස්" |
| | මහායාය වත්ත, මාකඳුර, "එළු මස්" |
| | මහායාය වත්ත, මාකඳුර, "ඌරු මස්" |

## විශෙෂ නිවේදනයයි

1959 පෙබරවාරි 4 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 පෙබරවාරි 6 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 පෙබරවාරි 2 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 ජනවාරි 16 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.